(නවවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක **24.**]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2022 ඔක්තෝබර් 19 බදාදා පූ.භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

---

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **නසීර් අහමඩ් මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා,** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්දා මහතා,** ධීවර අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **නලින් ප්‍රනාන්දු මහතා,** වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා

ගරු **නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **රොෂාන් රණසිංහ මහතා,** ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා සහ වාරිමාර්ග අමාත්‍යතුමා

ගරු **කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** සෞඛ්‍ය අමාත්‍යතුමා සහ ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා

ගරු **ජනාධිපති නීතිඥ එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩයනා ගමගේ මහත්මිය,** සංචාරක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා,** ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. වී. චානක මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සිසිර ජයකොඩි මහතා,** දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **චාමර සම්පත් දසනායක මහතා,** ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා,** ධීවර රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රෝහණ දිසානායක මහතා,** ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුප පස්කුවල් මහතා,** සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජගත් පුෂ්පකුමාර මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක ප්‍රියන්ත මහතා,** ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශාන්ත බණ්ඩාර මහතා,** ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** පිරිවෙන් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කේ. කාදර් මස්තාන් මහතා,** ග්‍රාමීය ආර්ථික රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සුරේන් රාඝවන් මහතා,** උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. වියාලේන්ද්‍රන් මහතා,** වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** තාක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **කපිල අතුකෝරල මහතා**

ගරු **නීතිඥ තලතා අතුකෝරල මහත්මිය**

ගරු **සම්පත් අතුකෝරල මහතා**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු වජිර අබේවර්ධන මහතා

ගරු අශෝක් අබේසිංහ මහතා

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු මායාදුන්න චින්තක අමල් මහතා

ගරු තවරාජා කලෛයි අරසන් මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු තිසකුට්ටි ආරච්චි මහතා

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු එම්. උදයකුමාර් මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු අකිල එල්ලාවල මහතා

ගරු ලලිත් එල්ලාවල මහතා

ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිදිගොඩ මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු උදය ගම්මන්පිල මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු නීතිඥ අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු නිපුණ රණවක මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු සී. වී. විග්නේෂ්වරන් මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු නීතිඥ මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**

**ගරු නීතිඥ වන්දිම වීරක්කොඩි මහතා**

**ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා**

**ගරු ඩී. වීරසිංහ මහතා**

**ගරු වීරසුමන වීරසිංහ මහතා**

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**

**ගරු කුමාර වෙල්ගම මහතා**

**ගරු ජගත් සමරවික්‍රම මහතා**

**ගරු ජයන්ත සමරවීර මහතා**

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**

**ගරු එච්. එම්. එම්. හරීස් මහතා**

**ගරු කබීර් හෂීම් මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු ජයරත්න හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

ධම්මික දසානායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1.ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2020 සහ 2021 වර්ෂ සඳහා ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ කර්මාන්ත අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**2. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** (1) අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා වෙනුවෙන් එම කාරක සභාවේ සාමාජික මන්ත්‍රී ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද —

i. නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත;

ii. අන්තිම කැමති පත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත;

iii. ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත;

iv. ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත;

v. වංචා වැලැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත;

vi. ළමයින් සහ තරුණ තැනැත්තන් පිළිබඳ (සංශෝධන) පනත් කෙටුම්පත;

vii. අන්තරායකර සත්ත්ව (සංශෝධන) පනත් කෙටුම්පත;

viii. සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත;

ix. සුළු හිමිකම් අධිකරණ කාර්ය පටිපාටිය පනත් කෙටුම්පත;

x. පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත;

xi. අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත;

xii. 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ වාර්ෂික වාර්තාව;

xiii. 2020 වර්ෂය සඳහා අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

xiv. 2019 සහ 2020 වර්ෂ සඳහා ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තා

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා වෙනුවෙන් එම කාරක සභාවේ සාමාජික මන්ත්‍රී ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද (54 අධිකාරය වූ) බන්ධනාගාර ආඥාපනතේ 94 වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලද රීති සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී

**3. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

මොණරාගල, කුඹුක්කන, 14 කණුව, දරන ස්ථානයෙහි පදිංචි ජේ.ඒ. ගුණතිලක මහතාගෙන් ලැබුණු 2022.08.02 දිනැති පෙත්සම ගරු කුමාරසිරි රත්නායක මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4.පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1):** ගරු ගුණතිලක රාජපක්ෂ මහතා, ගරු කුමාරසිරි රත්නායක මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"වීමංසා ධම්මගුප්ත පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

ඒ අනුව පනත් කෙටුම්පත පළමුවර කියවා මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52 (6) අනුව වාර්තා කිරීම සඳහා පනත් කෙටුම්පත බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික අමාත්‍යවරයා වෙත යොමු කරන ලදී.

**5. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2):** ගරු වීරසුමන වීරසිංහ මහතා, ගරු නිමල් පියතිස්ස මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී සීලානන්ද පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

ඒ අනුව පනත් කෙටුම්පත පළමුවර කියවා මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52 (6) අනුව වාර්තා කිරීම සඳහා පනත් කෙටුම්පත බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික අමාත්‍යවරයා වෙත යොමු කරන ලදී.

**6.නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත, —** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය"යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

(පූ. භා.11.44 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

"ගරු නීතිඥ මධුර විතානගේ මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ .භා. 1.45 ට ගරු නීතිඥ මධුර විතානගේ මහතා මූලාසනාරූඪ විය.)

"ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ .භා. 3.06 ට ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනාරූඪ විය.)

"ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනාරූඪ විය යුතු ය"යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ .භා 4.08 ට ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනාරූඪ වූවා ය.)

(අ. භා. 4.27 ට කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය'' යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේ දී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය සභා සම්මත විය.

2 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 1වැනි පිටුවේ 9 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''3.(1) නීති අධ්‍යාපන සභාව විසින් පවත්වනු ලබන'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 1වැනි පිටුවේ 26 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''ලබා ගැනීමට හිමිකමක් ඇත්තේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් ලබා දී ඇති සෑම නොතාරිස්වරයකු ම, නොතාරිස්වරයකු ලෙස වෘත්තියේ යෙදීම ආරම්භ කිරීමට පෙරාතුව, වැඩ ආරම්භ කිරීමේ ලිපියක් අදාළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දෙනු ලැබිය යුතු ය.'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

3 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 1වැනි පිටුවේ 27 වැනි පේළියේ සිට 30 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙකද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''3. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ආ) නොතාරිස්වරයකු ලෙස ස්වකීය කාර්ය යථා පරිදි ද විශ්වාසනීය ලෙස ද ඉටු කිරීම සඳහා, ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වන රුපියල් දස දහසක මුදලක් තැන්පත් කර මහාධිකරණය ඉදිරියෙහි ඇපකරයක් ලියා අත්සන් කරනු ලැබිය යුතු ය; සහ";

(2) එහි (2) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

> "(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් සෑම ඇපකරයක් ම නොතාරිස් බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රදේශය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති මහාධිකරණ විනිශ්චයකාරවරයා ඉදිරියෙහි අත්සන් කරනු ලැබිය යුතු ය.";

(3) එහි (3) වන උපගන්තිය ඉවත් කිරීමෙන්.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

4 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 2 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 3 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"4. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ "ඉහත සඳහන් එකී ඇපකරය සහ සුරැකුම" යන වචන වෙනුවට "ඉහත සඳහන් එකී ඇපකරය" යන වචන සහ "රුපියල් දස දහසකට නොඅඩු" යන වචන වෙනුවට "රුපියල් විසිපන් දහසකට නොඅඩු" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

5 වැනි වගන්තියේ සිට 8 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

9 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 3 වැනි පිටුවේ 5 වැනි පේළියේ සිට 38 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

| | |
|---|---|
| “හිස් කොළවලට හෝ අසම්පූර්ණ ආකෘති පත්‍රවලට අත්සන නොගත යුතු බව | (3) ඔහු, තමා ඉදිරිපිට ලියා අත්සන් කරන ලද හෝ ලියා අත්සන් කිරීමට නියමිත යම් ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් සම්පූර්ණයෙන් ලියනු ලබන තෙක් හෝ එය සුලේඛනය කරනු ලබන තෙක්, එම ඔප්පුව හෝ සාධන පත්‍රය ලියා අත්සන් කරන්නෙකුට හෝ යම් සාක්ෂිකරුවකුට, එකී ඔප්පුවට හෝ සාධන පත්‍රයට හෝ එහි අනුපිටපතට හෝ නොතාරිස්ගේ පිටපතට එකී ලියා අත්සන් කරන්නාගේ හෝ සාක්ෂිකරුගේ නම අත්සන් කිරීමට හෝ සලකුණ යෙදීමට හෝ එකී ලියා අත්සන් කරන්නාට, අවස්ථාවෝචිත පරිදි, වම් හෝ දකුණු මහපට ඇඟිල්ලේ සලකුණ හෝ වෙනත් යම් ඇඟිල්ලක හෝ පාදයේ ඇඟිල්ලක සලකුණ තැබීමට නියම කිරීම අවසර දීම හෝ එවැනි අත්සන් තැබීමක්, සලකුණක් යෙදීමක් හෝ අතේ හෝ පාදයේ ඇඟිලි සලකුණ තැබීමක් සිදුවීමකට ඉඩ නොදිය යුතු ය; හෝ එවැනි යම් කාර්යයක් සඳහා පසුව භාවිත කිරීමට අදහස් කරන යම් කඩදාසියක හෝ කොළයක එකී ලියා අත්සන් කරන්නාට හෝ සාක්ෂිකරුට එකී ලියා අත්සන් කරන්නාගේ හෝ සාක්ෂිකරුගේ නම අත්සන් කිරීමට හෝ සලකුණ යෙදීමට සහ එකී ලියා අත්සන් කරන්නාට, අවස්ථාවෝචිත පරිදි, වම් හෝ දකුණු මහපට ඇඟිල්ලේ සලකුණ හෝ වෙනත් යම් ඇඟිල්ලක හෝ පාදයේ ඇඟිල්ලක සලකුණ තැබීමට නියම කිරීම නොකළ යුතු ය. කිසිදු අවස්ථාවක යම් ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් සඳහා වූ හිස් කඩදාසියකට හෝ යම් අසම්පූර්ණ ආකෘති පත්‍රයකට එකී ලියා අත්සන් කරන්නාගේ අත්සන ගැනීම හෝ වම් හෝ දකුණු මහපට ඇඟිල්ලේ සලකුණ හෝ වෙනත් යම් ඇඟිල්ලක සලකුණක් හෝ පාදයේ ඇඟිල්ලක සලකුණක් ගැනීම නොකළ යුතු ය.”; |

“සංශෝධනය පිළිගත යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 4 වැනි පිටුවේ 28 වැනි වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

“යුතු ය.”

(4) එහි (6) වන රීතියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් රීතිය ඇතුළත් කිරීමෙන්:-

| | |
|---|---|
| “නියමිත මුද්දර ගාස්තු ගෙවීම සහතික වීම. | (6) නියමිත මුද්දර ගාස්තු ලබා දී ඇති බවට සහතික වශයෙන් දන්නේ නම් මිස, ඔහු විසින් යම් සාධන පත්‍රයක් සත්‍යායනය කිරීම හෝ සහතික කිරීම නොකළ යුතු ය.”; |

“සංශෝධනය පිළිගත යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 5 වැනි පිටුවේ 19 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ලියා අත්සන් කරන තැනැත්තන්ගෙන් එක් අයකු හෝ එය සහතික";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 5 වැනි පිටුවේ 30 වැනි පේළියේ සිට 38 වැනි පේළිය දක්වා පේළි ( ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ලියා අත්සන් කරන්නන්ගේ සහ සාක්ෂිකරුවන් ගේ සම්පූර්ණ නම් නිසැකවම දැන ගත යුතු බව

(14) ඔහු විසින්, ඔප්පුවට හෝ සාධන පත්‍රයට යම් ලියා අත්සන් කරන්නකු හෝ සාක්ෂිකරුවකු අත්සන් කිරීමට හෝ සලකුණු තැබීමට පෙර හා යම් ලියා අත්සන් කරන්නකු වම් හෝ දකුණු මහපට ඇඟිල්ලේ සලකුණ හෝ වෙනත් යම් ඇඟිල්ලක හෝ පාදයේ ඇඟිල්ලක සලකුණ තැබීමට පෙර, සහ යම් ඔප්පුවක හෝ සාධන පත්‍රයක ලියා අත්සන් කරන්නකු සංස්ථාපිත මණ්ඩලයක් වේ නම්, එහි මුද්‍රාව තැබීමට සලස්වා අධ්‍යක්ෂ මණ්ඩලයේ අත්සන් හෝ එම ඔප්පුව හෝ සාධන පත්‍රය අත්සන් කිරීමට යෝජනා සම්මතයකින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය දෙන ලද යම් තැනැත්තකුගේ අත්සන ලබා ගැනීමට පෙර, එකී ලියා අත්සන් කරන්නාගේ හෝ සාක්ෂිකරුවන්ගේ සම්පූර්ණ නම් නිශ්චය කර ගත යුතු අතර, එකී යම් ලියා අත්සන් කරන්නාගේ හෝ සාක්ෂිකරුවකුගේ නම අනන්‍යතා ලේඛනවල සඳහන් නමට වඩා වෙනස් වේ නම්, එම ඔප්පුව හෝ සාධන පත්‍රය සහතික කිරීමේ දී එම නමින් සහ අත්සනේ ලියන ලද නමින් එකී ලියා අත්සන් කරන්නා හෝ සාක්ෂිකරුවා විස්තර කළ යුතු ය. ලියා අත්සන් කරන තැනැත්තා සංස්ථාපිත මණ්ඩලයක් වන අවස්ථාවක, එම ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ නොතාරිස්ගේ පිටපතට, එකී ඔප්පුව හෝ සාධන පත්‍රය ලියා අත්සන් කරන තැනැත්තාට බලය පවරමින් අධ්‍යක්ෂ මණ්ඩලය කළ යෝජනා සම්මතයේ පිටපතක් ඔහු විසින් ඇමිණිය යුතු ය .";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 6 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 20 වැනි පේළිය දක්වා පේළි ( ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 6 වැනි පිටුවේ 13 වැනි පේළියේ සිට 30 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

නිශ්චල දේපලක් සම්බන්ධයෙන් වන ඔප්පුවකට හෝ සාධන පත්‍රයකට, ලියා අත්සන කරන්නා, ඇටර්නි බලකරු, සංස්ථාපිත මණ්ඩලයේ බලයලත් තැනැත්තා තම ඇඟිලි සලකුණ තැබිය යුතු බව

(15අ) (1) (අ) නිශ්චල දේපලක් සම්බන්ධයෙන් වන ඔප්පුවක් හෝ සාධනපත්‍රයක් ලියා අත්සන් කරන සෑම-

(i) ලියා අත්සන් කරන්නකු ම;

(ii) (මින්මතු "ඇටර්නි බලකරු" ලෙස හැඳින්වෙන) ඇටර්නි බලපත්‍රය දරන්නකු ම; හෝ

(iii) සංස්ථාපිත මණ්ඩලයක බලයලත් තැනැත්තකු ම,

(15) වන රීතියේ විධිවිධානවලට අතිරේකව, එකී ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ මුල් පිටපතේ, අනු පිටපතේ සහ නොතාරිස්ගේ පිටපතේ සිය අත්සනට ඉහළින් හෝ පැත්තෙන් යම් අතක මහපට ඇඟිල්ලේ සලකුණ තැබිය යුතු ය.

(ආ) ලියා අත්සන් කරන්නකුගේ, ඇටර්නි බලකරුවකුගේ හෝ බලයලත් තැනැත්තකුගේ මහපට ඇඟිලි සලකුණ ලබා ගත නොහැකි වන අවස්ථාවක, එවැනි ලියා අත්සන් කරන්නකු, ඇටර්නි බලකරුවකු හෝ බලයලත් තැනැත්තකු එකී ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ මුල් පිටපතේ, අනුපිටපතේ සහ නොතාරිස් පිටපතේ සිය අත්සනට ඉහළින් හෝ පැත්තෙන් යම් අතක ඇඟිලි සලකුණ හෝ පාදයක ඇඟිලි සලකුණ තැබිය යුතු ය.

(ඇ) ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් ඇටර්නි බලකරු විසින් ලියා අත්සන් කරනු ලබන අවස්ථාවක දී, එකී ඔප්පුව හෝ සාධන පත්‍රය ලියා අත්සන් තබන වේලාවේ දී එම ඇටර්නි බලපතය අව්‍යාජ හා වලංගු බවටත් ඇටර්නි බලපත්‍රයේ දීමනාකරු ජීවත්ව සිටින බවටත් තහවුරු කරන දිවුරුම් ප්‍රකාශයක් ඇටර්නි බලකරු විසින් නොතාරිස්වරයා වෙත ලබා දිය යුතු ය.

(ඇ) දීමනාලාභියා බාලවයස්කරුවක් වන විට, නෛතික භාරකරු හෝ භාරකරු මෙම වගන්තියේ අරමුණු සඳහා දීමනාලාභියා වෙනුවෙන් ක්‍රියා කිරීමට ශක්නුතාව ඇති පුද්ගලයකු විය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 7 වැනි පිටුවේ 29 වැනි පේළිය සහ 30 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(iii) පැවරුම් ඔප්පුවක් හෝ තෑගි ඔප්පුවක් හෝ භුවමාරු ඔප්පුවක් හෝ අන්තිම කැමති පත්‍රයක් සම්බන්ධයෙන් වන විට දී,";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 8 වැනි පිටුවේ 3 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ඇ) ඔහු විසින් ඔප්පුවේ මුල් පිටුවේ, ඔහුගේ සම්පූර්ණ";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 10 වැනි පිටුවේ 25 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(30අ) තමා විසින් සහතික කරනු ලබන";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 11 වැනි පිටුවේ 8 වැනි පේළියේ සිට 10 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

10 වැනි වගන්තියේ සිට 12 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

13 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 14 වැනි පිටුවේ 25 වැනි පේළියේ සිට 30 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ලිත් මාස දොළහකට නොවැඩි යම් කාලයකට සුළු හෝ බරපතල වැඩ සහිතව බන්ධනාගාරගත කරනු ලැබීමට" යන වචනවල සිට එම උපවගන්තයේ අවසානය දක්වා වූ වචන වෙනුවට "රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

14 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 15 වැනි පිටුවේ 3 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"පහත දැක්වෙන අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 15 වැනි පිටුවේ 7 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"මගින් ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"ලියා අත්සන් කරන්නා" යනුවෙන්-

(අ) විකිණීමේ ඔප්පුවක් සම්බන්ධයෙන් වන විට විකුණුම්කරු සහ ගැනුම්කරු; සහ

(ආ) අනෙකුත් ඔප්පු හෝ සාධන පත්‍ර සම්බන්ධයෙන් වන විට එකී ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ පාර්ශ්වකරුවන්;

අදහස් වේ.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

15 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: දෙවන උපලේඛනයේ "ඉ" ආකෘතියේ පරිදි ...................... ලෙස අත්සන් කරන ලද සහ ස්වකීය (වම්/දකුණ" යන වචන වල සිට දරන මෙම ඔප්පුව ලියා අත්සන් කරන්නන් වන ( ලියා අත්සන්" යන වචන දක්වා වූ වචන වෙනුවට පහත කොටස ආදේශ කිරීමට:—

"පරිදි ................................... ලෙස අත්සන් කරන ලද) මෙහි ලියා අත්සන් කරනු ලබන සාක්ෂිකරුවන් වන ජාතික හැඳුනුම්පත් අංක ................................. දරන (සාක්ෂිකරුවන්ගේ සම්පූර්ණ නම සහ ලිපිනය ඇතුළත් කරන්න) යන අය ඉදිරිපිට දී (අපැහැදිලි ලෙස/ අවස්ථාවෝචිත පරිදි/ "පුවානාස්" ලෙස) අත්සන් තබනු ලැබුවා වූ ද සහ ස්වකීය (වම්/දකුණු මහපට ඇඟිල්ලේ හෝ වෙනත් ඇඟිල්ලක හෝ පාදයේ ඇඟිල්ලක) සලකුණ තැබුවා වූ ද මෙම ඔප්පුව ලියා අත්සන් කරන්නන් වන (ලියා අත්සන්";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

16 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 18 වැනි පිටුවේ 15 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

"ලබා දෙන ලද යම් තීන්දුවකට බලනොපාන බවට, -

(ඇ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙර සිය වෘත්තිමය කටයුතු ආරම්භ කර ඇති නොතාරිස්වරයකු ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියට අනුව ඇපකරයක් අත්සන් තැබීමේ වගකීමට යටත් නොවන බවට,";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

17 වැනි වගන්තිය සභා සම්මත විය.

අලුත් වගන්ති

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ අලුත් වගන්තිය: 2 වැනි පිටුවේ 3 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

"ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය ඉවත් කිරීම

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය ඉවත් කිරීම

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය ඉවත් කිරීම

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ "සුරැකුම" යන වචන වෙනුවට "ඇපකරය" යන වචනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය එහි (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1) නොතාරිස්වරයකුට එරෙහිව මහාධිකරණයේ අධිචෝදනා නගා ඇති අවස්ථාවක නීතිපතිවරයාගේ ඉල්ලීම මත, අමාත්‍යවරයා විසින්, එකී නොතාරිස්වරයාගේ නඩු විභාගය පැවැත්වෙන තුරු ඔහු නොතාරිස් ධුරයේ කාර්ය ඉටු කිරීමෙන් අත්හිටවනු ලැබිය හැකි ය.";

වගන්තිය දෙවැනිවර කියවිය යුතු ය යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

"වගන්තිය පනත් කෙටුම්පතට එකතු කළ යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ අලුත් වගන්තිය: 2 වැනි පිටුවේ 19 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

"ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (2) වන උපවගන්තියේ "සුරුකුම" යන වචනය වෙනුවට "ඇපය" යන වචනය ආදේශ කිරීමෙන්;

(2) එහි (3) වන උපවගන්තියේ "සුරුකුම" යන වචන වෙනුවට "ඇපය" යන වචන ඇතුළත් කිරීමෙන්.;

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය එහි (2) වන උපවගන්තියේ "මාර්තු" යන වචනය වෙනුවට "අප්‍රේල්" යන වචනය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ."

වගන්තිය දෙවැනිවර කියවිය යුතු ය යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

"වගන්තිය පනත් කෙටුම්පතට එකතු කළ යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය

"ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් සංශෝධන සහිතව තුන්වැනිවර කියවිය යුතු ය"යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව, සංශෝධිතාකාරයෙන් තුන්වැනිවර කියවා සභා සම්මත කරන ලදී.

**7. ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත**: දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය"යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය'' යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේ දී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය සභා සම්මත විය.

2 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 1 වැනි පිටුවේ 12 වැනි පේළියේ සිට 17 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''ඇටෝර්නි බලපත්‍රය'' යන්නෙන් යම් නීතිඥවරයකුට යම් තැනැත්තකු වෙනුවෙන් නීතිඥවරයකු ලෙස පෙනී සිටීමේ කාර්යය සඳහා දෙන ලද යම් ලිඛිත බලයක් හෝ අධිකාරබලයක් හැර, ඔහුව නියෝජනය කිරීමට, යම් කාර්යයක් ඉටු කිරීමට, ක්‍රියාවක් කිරීමට හෝ යම් වෙළඳාමක් හෝ ව්‍යාපාරයක් කරගෙන යාමට, එවැනි යම් තැනැත්තකු විසින් තවත් තැනැත්තකුට දෙන ලද්දා වූ ද -'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

3 වැනි වගන්තිය සභා සම්මත විය.

4 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 6 වැනි පිටුවේ 1 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''(ඉ) ප්‍රදානකරු විසින් අත්සන් කරන ලද'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

5 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 8 වැනි පිටුවේ 7 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් ලේඛනය ලියා''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

6 වැනි වගන්තියේ සිට 9 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය

''ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

''පනත් කෙටුම්පත දැන් සංශෝධන සහිතව තුන්වැනිවර කියවිය යුතු ය''යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව, සංශෝධිතාකාරයෙන් තුන්වැනිවර කියවා සභා සම්මත කරන ලදී.

**8. ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත:** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

''පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය''යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය'' යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේ දී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය සභා සම්මත විය.

2 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 4 වැනි පිටුවේ 4 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''පනත යටතේ ලියාපදිංචි කරන ලද හෝ මෙම ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 4 වැනි පිටුවේ 19 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"වූ හෝ බාලවයස්කාරයකුගේ හෝ සිහිවිකල තැනැත්තකුගේ හෝ මානසික වශයෙන් දුබල තැනැත්තකුගේ";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

3 වැනිවගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 7 වැනි පිටුවේ 28 සහ 29 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ලියාපදිංචිය අවලංගු කළේ යම් ඉඩමක් සම්බන්ධයෙන් ද හෝ ඉඩමක යම් සම්බන්ධතාවක් සම්බන්ධයෙන් ද, එකී ඉඩම සම්බන්ධයෙන් ම හෝ එකී සම්බන්ධතාව සම්බන්ධයෙන් ම එම කේවියට්කරු ම".

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

4 වැනි වගන්තියේ සිට 6 වැනි වගන්තිය දක්වා වන වගන්ති සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය

"ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් සංශෝධන සහිතව තුන්වැනිවර කියවිය යුතු ය"යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව, සංශෝධිතාකාරයෙන් තුන්වැනිවර කියවා සභා සම්මත කරන ලදී.

**9. අන්තිම කැමති පත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත:** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය"යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය'' යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේ දී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය සභා සම්මත විය.

2 වැනිවගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 1 වැනි පිටුවේ 11 සහ 12 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''සිටින්නා වූ යම් තැනැත්තකු විසින්, එකී තැනැත්තා මිය යන අවස්ථාවේ දී එකී තැනැත්තා ට අයත් සහ එකී තැනැත්තා විසින් පැවරීමක්,'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 1 වැනි පිටුවේ 18 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''අයිතිවාසිකම්, කොටස් හෝ සම්බන්ධතා, යෝග්‍ය බවට ඔහු විසින් සලකනු ලබන ආකාරයට, පැවරීමට'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 2 වැනි පිටුවේ 6 වැනි පේළියේ සිට 16 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

3 වැනි වගන්තියේ සිට 7 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය

''ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

''පනත් කෙටුම්පත දැන් සංශෝධන සහිතව තුන්වැනිවර කියවිය යුතු ය''යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව, සංශෝධිතාකාරයෙන් තුන්වැනිවර කියවා සභා සම්මත කරන ලදී.

**10.වංචා වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත:** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

''පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය''යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය'' යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේ දී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය සභා සම්මත විය.

2 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 1 වැනි පිටුවේ 7 වැනි පේළියේ සිට 15 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''වන වගන්තිය, ''එය ලිඛිත වන්නේ නම් ද'' යන වචනවල සිට ඒ වගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 1 වැනි පිටුවේ 19 වැනි පේළිය සහ 20 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''සෑම ලියා අත්සන් කරන්නකු විසින් ම අත්සන්'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 1 වැනි පිටුවේ 23 වැනි පේළියේ සිට 26 වැනි පේළිය දක්වා වූ පේළි ( ඒ පේළි දෙකක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''(ආ) එකී සෑම ලියා අත්සන් කරන්නකුගේ ම වම් හෝ දකුණු මාපට ඇඟිලි සලකුණ හෝ එවැනි ලියා අත්සන් කරන්නකුගේ'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 2 වැනි පිටුවේ 7 වැනි සහ 8 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''ලියා අත්සන් කරන්නකුගේ අත්සන හෝ මාපට ඇඟිලි සලකුණ ලබා'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 2 වැනි පිටුවේ 11 වැනි සහ 12 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''අතර, එකී ලියා අත්සන් කරන්නා විසින් අවස්ථාවෝචිත පරිදි වෙනත් යම්'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 2 වැනි පිටුවේ 15 වැනි පේළියේ සිට 28 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

3 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 3 වැනි පිටුවේ 4 සහ 5 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''දක්වා වූ වචන ඉවත්කර ඒ වෙනුවට ''(2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 3 වැනි පිටුවේ 10 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''(2) තෙස්තමේන්තුකරු'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 3 වැනි පිටුවේ 20 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''මාපට ඇඟිලි සලකුණ'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 3 වැනි පිටුවේ 24 වැනි පේළියේ සිට 31 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 4 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 20 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

4 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 4 වැනි පිටුවේ 23 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''(1) ''තෙස්තමේන්තුකරුගේ හෝ තෙස්තමේන්තුකාරියගේ අත්සන'' යන වචන වෙනුවට ''අත්සන සහ;''

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 4 වැනි පිටුවේ 26 වැනි පේළියේ සිට 31 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට :—

''සලකුණක් හෝ පාදයක;'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 5 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 5 වැනි පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට: —

''එසේ වුව ද, තෙස්තමේන්තුකරුගේ අවස්ථාවෝචිත පරිදි වම් හෝ දකුණු මාපට ඇඟිලි සලකුණ හෝ වෙනත් යම් ඇඟිලි සලකුණක් යම් හේතුවක් මත ලබාගැනීමට නොහැකි වූ අවස්ථාවක දී, තෙස්තමේන්තුකරු විසින්''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

5 වැනි වගන්තිය සහ 6 වැනි වගන්තිය සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය

''ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

''පනත් කෙටුම්පත දැන් සංශෝධන සහිතව තුන්වැනිවර කියවිය යුතු ය''යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව, සංශෝධිතාකාරයෙන් තුන්වැනිවර කියවා සභා සම්මත කරන ලදී.

**11. කල් තැබීම :** එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුයෙන් අ.භා. 5.45ට කථානායකවරයා විසින් අද දින සභා සම්මතිය අනුව පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2022 ඔක්තෝබර් 20 බ්‍රහස්පතින්දා පූ .භා. 9.30 වනතෙක් කල් ගියේ ය.